# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2304/54 – 2022 නොවැම්බර් 03 වැනි බ්‍රහස්පතින්දා – 2022.11.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2019/59.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2020.01.03 දිනැති හා අංක 2156/33 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.12.26 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මහනුවර, වට්ටාරන්තැන්න පාර, අංක 36/9 හි පදිංචි ඩී. ඒ. රණධීර මයා සහ බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 9/428 හි පිහිටි පොල් වගාකිරීමේ මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.10.05 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 ඔක්තෝබර් මස 19 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**කොළඹ බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේදීය.**

බේරුම්කරු ඕබඩගේ ලීලාරත්න මැතිතුමා ඉදිරිපිටදී ය.

ඩී. ඒ. රණධීර මහතා,
අංක 36/9,
වට්ටාරම්තැන්න පාර,
මහනුවර.

ගොනු අංකය: IR/COM/04/2019/59.

*පළමුවැනි පාර්ශ්වය*

බේරුම්කරණ අංක: A /03/2020.

පොල් වගාකිරීමේ මණ්ඩලය,
අංක 9/428,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

*දෙවන පාර්ශ්වය*

අතර පවත්නා කාර්මික ආරාවුල.

නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරුවකු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

"පොල් වගාකිරීමේ මණ්ඩලයේ සේවය කළ ඩී. ඒ. රණධීර මහතාට 2016.06.28 දින සිට 2016.12.25 දින දක්වා වැඩ තහනමට ලක් කර සිටි කාලය සඳහා හිඟ වැටුප් නොගෙවීමෙන් අසාධාරණයක් සිදුව තිබේද? යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහනය කුමක්ද? " යන්න පිළිබඳව වේ.

මෙම ආරාවුල සම්බන්ධයෙන් පළමු පාර්ශ්වයේ හා දෙවන පාර්ශ්වයේ පළමු හා දෙවැනි ප්‍රකාශ ගොනු කිරීමෙන් අනතුරුව පරීක්ෂණය ආරම්භ කරන ලදී.

**පෙනී සිටීම.**

පළමු පාර්ශ්වය වෙනුවෙන් නියෝජිත කරපුටුගල මහතා පෙනී සිටින ලදී.

දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් කළමණාකරු මානව සම්පත් එම්.ඩී.එස්. රණතුංග මහතා සමග කළමණාකාර සහකාර දීපිකා සමන්මලී මහත්මිය පෙනී සිටි,

දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් රජයේ නීතිඥ ගංගානි උක්වත්තගේ මහත්මිය පෙනී සිටී.

**ආරාවුලේ පසුබිම.**

පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කාර ඩී.ඒ. රණධීර මහතා 2015 වසරේ බඳුන් පොල් පැල බෙදා දීමේදී සිදුවී ඇති අක්‍රමිකතාවයක් හේතුවෙන් විනය පරීක්ෂණයක් සිදුකර ඇති අතර, එම විධිමත් විනය පරීක්ෂණය අතරතුර ඔහු විසින් කළහකාරී ලෙස හැසිරීම හේතුකොට ගෙන ඔහුගේ වැඩ තහනමකට ලක්කර ඇත. සිදුකරන ලද විනය පරීක්ෂණයේදී ඔහු චෝදනා සියල්ලටම වරදකරුකර පහත සඳහන් දඬුවම් පමුණුවා ඇත. එනම්,

I. 2016.12.26 දින සිට කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලයේ සේවයේ පිහිටුවීම.
II. වැඩ තහනම්කල දින සිට 2016.12.25 දින දක්වා වැටුප් රහිතව තැබීම.

III. ක්ෂේත්‍ර රාජකාරිවල යෙදවීමට පෙර ඔහුගේ විනය හා හැසිරීම පිළිබඳ මාස 03ක අධීක්ෂණ කාලයකට යටත්ව ප්‍රාදේශීය කාර්යාලයේ කාර්යාලීය රාජකාරි වල යෙදවීම හා දෙවනුව රාජකාරි කටයුතු පිළිබඳව ප්‍රාදේශීය කළමණාකරුගේ නිර්දේශය ලබා ගැනීමෙන් පසු ක්ෂේත්‍ර රාජකාරිවල යෙදවීම.

IV. 2015 වැටුප් වර්ධකය විලම්භනය කිරීම.

V. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 29/2011 හා 2011-12-21 ප්‍රකාරව ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ 24.3 උප වගන්තිය යටතේ වන බරපතල ගණයේ වරදකට වරදකරු වන බැවින් රු. 30000/- ක මුදලක් වාරික 24කින් අයකර ගැනීම.

මෙම රු. 30000/- විනය පරීක්ෂණ ගාස්තු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව අයකර ගැනීම අත්හිටුවා ඇත.

මෙම විනය දඬුවම් වලින් II වැනි දඬුවම වන සේවය අත්හිටුවා ඇති කාලයට හිඟ වැටුප් නොගෙවීම යන්න සම්බන්ධයෙන් පමණක් ඉල්ලීමක් කර තිබීම විශේෂයකි.

**ප්‍රදානය ලබාදීමට හේතුපාදක වූ කරුණු**

මෙම ආරාවුලට අදාල දෙපාර්ශ්වයේ ලිඛිත දේශණ හා දිවුරුම් ප්‍රකාශ මෙන්ම සාක්ෂි සටහන් ද ඉතා සුපරික්ෂාකාරීව නිරීක්ෂණය කලෙමි. ඒ අනුව මෙම බේරුම්කරණ යොමුව මගින් ඉල්ලා සිටින සහනය අයැද සිට ඇත්තේ මෙම ඉල්ලුම්කාර සේවකයා වෙත යොමුකරන ලද චෝදනා පත්‍රයක් මත පරීක්ෂණයක් පැවැත්වෙන අවස්ථාවේදී සිදුවී ඇති සිද්ධියක් පදනම් කරගෙන ඔහුගේ සේවය තහනම්කර ඇති අතර එම කාලයට අදාලව වැටුප් නොගෙවීමට ගෙන ඇති තීරණයට එරෙහිව වන අතර, එම කාලයට අදාල වැටුප් ලබා දෙන ලෙසට ඉල්ලා සිටී.

අදාල සිද්ධිය වන්නේ විනය පරීක්ෂණය පැවැත්වෙමින් පැවති 2016 ජුනි මස 22 වැනි දිනදී පැමිණිල්ල මෙහෙයවන නිලධාරියාට පරුෂ වචනයෙන් බැන වැදීම සහ පහර දීම යන සිද්ධියක් සම්බන්ධයෙනි. එසේ සේවකයාගේ වැඩ තහනම් කරන ලද ලිපියේ එනම් පළමු පාර්ශ්වය විසින් මෙම බේරුම්කරණය වෙත ගොනුකර ඇති ''ඇ 6'' දරණ ලිපියෙහි සඳහන් වන්නේ 2016-06-22 දිනැති සිදුවීම බරපතල එකක් බවත් ඒ අනුව එම සිද්ධිය සම්බන්ධයෙන් මූලික විමර්ෂණයක් සිදුකර තීරණයක් ගන්නා තෙක් වහාම ක්‍රියාත්මක වන පරිදි වැඩ තහනමකට ලක්කරන බවත් වේ.

මෙම 2016 ජුනි 22 දින සිද්ධිය සම්බන්ධයෙන් මූලික විමර්ෂණයක් සිදුකර එම මූලික විමර්ෂණ නිලධාරී තැන විසින් සිය වාර්තාව ඉදිරිපත් කර ඇත. එකී මූලික පරීක්ෂණ වාර්තාව ''ඇ 7'' ලෙස සලකුණුකර ඉදිරිපත් කර ඇත. එම වාර්තාවෙන් නිරීක්ෂණය කර ඇත්තේ පැමිණිල්ල මෙහෙයවූ නිලධාරියා අදූරදර්ශීව කටයුතු කර ඇති බවත්, ඔහු විසින් මෙම නඩුවේ පළමු පාර්ශ්වය වන සේවකයාට පහර දී ඇති බවත් වේ. එම වාර්තාවේ නිර්දේශය කෙරෙහි මාගේ අවධානය යොමුකරමි. එනම්,

''මෙවන් පෙර වැරදි නොමැති ඩී. ඒ. රණධීර මහතාත් ආවේගශීලීව කටයුතු කර ඇති බැවින් වැටුප් වර්ධකයක් අත්හිටුවීමටත් ආයතන ප්‍රධානීන්ගේ අභිමතය හා සේවා අවශ්‍යතාවට අනුව සානුකම්පිතව සලකා සුදුසු ස්ථාන මාරුවක් මත සේවයේ පිහිටුවීම සුදුසු යැයි නිර්දේශ කරමි.'' ලෙසට වේ.

මෙම නිර්දේශයට අනුව මෙම පළමු පාර්ශ්වයේ සේවකයා නැවත 2016-12-26 දින ස්ථාන මාරුවක්ද සමග කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලයේ සේවයේ පිහිටුවා ඇත.

මේ සම්බන්ධයෙන් තවදුරටත් පරීක්ෂා කිරීමේදී මාගේ විශේෂ අවධානයට ලක්වූ කරුණු වන්නේ දෙවැනි පාර්ශ්වය වන පොල් වගාකිරීමේ මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී විසින් 2016-12-23 දාතමින් යුතුව නිකුත්කර ඇති විනය නියෝගය සම්බන්ධයෙනි. එකී විනය නියෝගයේ අංක 1 දරන නියෝගය පහත පරිදි වේ.

''1. ඔබ වැඩ තහනම්කල දින සිට 2016-12-25 දින තෙක් ඔබව වැටුප් රහිතව තැබීම.''

මෙම දඬුවම ලබාදී ඇත්තේ විනය පරීක්ෂණය අතරතුර සිදුවූ කලබලකාරී සිද්ධිය සම්බන්ධයෙන් කරන ලද වැඩ තහනම් කිරීම මත පදනම්ව බව මනාව පැහැදිලිවේ. ඒ බව මනාව තහවුරු වන්නේ පළමු පාර්ශ්වය විසින් ගොනු කර ඇති ''ඇ6'' ලේඛණය වන වැඩ තහනම් කිරීමේ 2016-06-28 දිනැති ලිපිය අනුව වේ. එසේ නම් වැඩ තහනම් කල හේතුව මත දඬුවමක් පැමිණවීම සිදුකල යුතුවන්නේ එම සිද්ධිය සම්බන්ධයෙන් චෝදනා පත්‍රයක් නිකුත්කොට විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමෙන් අනතුරුව බව මනාව පැහැදිලි කරුණකි. එහෙත් ඉහතකී සිද්ධිය සම්බන්ධයෙන් වන මූලික විමර්ශණ නිලධාරී වාර්තාව අනුව මෙම සිද්ධිය සම්බන්ධයෙන් චෝදනා පත්‍රයක් නිකුත් කිරීමට ඔහු විසින් නිර්දේශකර නොමැති අතර, උක්ත විනය පරීක්ෂණයේදී පැමිණිල්ල මෙහෙයවූ නිලධාරියාගේ අදූරදර්ශී ක්‍රියා කලාපය විවේචනයට ලක්කර ඇත. එමෙන්ම එම විමර්ෂණ වාර්තාවෙන් මෙම පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරුගේ වැටුප් වර්ධකයක් විලම්බනය කරන ලෙසට නිර්දේශ කර ඇත.

මෙම දෙපාර්ශ්වය විසින් ඉදිරිපත්කරන ලද කරුණු මෙන්ම සලකුණුකර ඉදිරිපත් කරනලද ලේඛන මෙන්ම සාක්ෂි සටහන් පරීක්ෂා කිරීමේදී පහත කරුණු මාගේ දැඩි නිරීක්ෂණයට ලක් විය. එනම් 2016 ජුනි මස 22 වැනි සිද්ධිය සම්බන්ධයෙන් පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරු විසින් පොලිසියට කරන ලද පැමිණිල්ල සම්බන්ධයෙන් උක්ත විනය පරීක්ෂණය මෙහෙයවන ලද පෙරේරා මහතා කිසිදු අවස්ථාවකදී පොලිස් පරීක්ෂණවලට හෝ සමථ මණ්ඩල පරීක්ෂණවලට සහභාගිවී නොමැත. ඒ සම්බන්ධයෙන් දෙවැනි පාර්ශවය කිසිදු හබකිරීමක් සිදුකර නොමැති අතර, පොලීසියට සිදුකර ඇති ප්‍රකාශයේ ඇති කරුණු හා සාක්ෂි ලෙස ලබාදුන් දිවුරුම් ප්‍රකාශයේ ඇති පරස්පර පමණක් සලකුණු කරන ලදී. තවද පළමු පාර්ශ්වයේ සාක්ෂි ලෙස ලබාදුන් දිවුරුම් ප්‍රකාශයේ "ඇ 5" ලෙසට අමුණා තිබූ මාතලේ මහ රෝහලෙහි උපදේශක ශෛල්‍ය වෛද්‍යවරයා (Consultant Surgeon) විසින් 2016-06-24 දිනැතිව නිකුත් කර ඇති වෛද්‍ය වාර්තාවට අනුව එකී අංක 5 යටතේ ඇති වෛද්‍ය නිලධාරියාගේ අදහස යන්නට ඔහු සඳහන්කර ඇත්තේ "Assault" (පහරදීමක්) ලෙසට වේ. මෙම වෛද්‍ය වාර්තාව සම්බන්ධයෙන් දෙවැනි පාර්ශ්වය කිසිදු විරෝධතාවයක් හෝ හරස් ප්‍රශ්න ඇසීමක් හෝ සිදුකර නොමැති බැවින් එය පිළිගත් සාක්ෂියක් ලෙසට තීරණය කිරීමට සිදුවේ.

දෙවැනි පාර්ශ්වය විසින් පළමු පාර්ශ්වයේ සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න විමසීමේදී කිසිදු අවස්ථාවක ඔහු විසින් ඉදිරිපත්කර ඇති දිවුරුම් ප්‍රකාශයේ වැදගත් කරුණු බිඳ හෙළීමට උත්සාහ කර නැති අතර, දෙවැනි පාර්ශ්වය විසින් මෙම බේරුම්කරණ යොමුවට අදාලව සාක්ෂි මෙහෙයවීමට ද කටයුතු කර නොමැති බව ද නිරීක්ෂණය කලෙමි.

අනික් අතට චෝදනා පත්‍රයේ සඳහන් වරදවල් 5 ටම චූදිත වැරදිකරු කර ඇති අතර, විධිමත් විනය පරීක්ෂණය අතරතුර සිදුවූ කලහකාරී සිද්ධිය සම්බන්ධයෙන් කිසිදු අවස්ථාවක චෝදනා පත්‍රයක් නිකුත්කර නොමැත. මෙම සේවකයාගේ වැඩ තහනම සිදුකර ඇත්තේ විධිමත් විනය පරීක්ෂණය සිදුකරගෙන යන අතරතුර 2016-ජුනි මස 22 වැනි දින සිදුවූ සිද්ධියක් පදනම්කරගෙන ඇති අතර, ඒ සිද්ධිය සම්බන්ධයෙන් කරන ලද මූලික විමර්ෂණ වාර්තාවට අනුව සේවකයා නැවත 2016-12-26 වැනි දින සිට සේවයේ පිහිටුවා ඇති බවට පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කාර සේවකයාගෙන් දෙවැනි පාර්ශ්වයේ නීතිඥවරිය විසින් හරස් ප්‍රශ්ණ ඇසීමේදී 2021-03-22 සාක්ෂි සටහන්වල 15 වන පිටුවෙහි එනම් ගොනුවේ 119 වැනි පිටුවේ මෙසේ හරස් ප්‍රශ්න විමසා ඇත.

එම සාක්ෂි සටහන්වලට අදාල පිටුවෙහි ඉහල සිට පහලට 3 වන ප්‍රශ්නය

ප්‍ර. දැන් මේ නිර්දේශ අනුව තමන් නැවත සේවයේ පිහිටෙව්ව නේද?

පි. ඔව්

ප්‍ර. එම නිසා තමයි තමන්ට චෝදනා පත්‍රයක් ලබා දුන්නේ නැත්තේ එහෙම නේද?

පි. මම පිළිගන්නේ නැහැ.

දෙවැනි පාර්ශ්වයේ නීතිඥවරිය විසින්ම විධිමත් විනය පරීක්ෂණය අතරතුර සිදුවී ඇති සිද්ධියට අදාල මූලික විමර්ෂණ වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කල බවට හා ඒ නිසාම චෝදනා පත්‍රයක් එම සිද්ධියට අදාලව නිකුත්කර නොමැති බවට තහවුරු කර ඇත.

ඉහත කරුණු පිළිබඳව හා අනිකුත් සියලුම සාක්ෂි හා ලේඛනවලට අනුව සලකා බැලීමේදී මා හට නිරීක්ෂණය වන්නේ මෙම පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරු වෙත නිකුත්කර ඇති විනය නියෝගයේ වැඩ තහනමට අදාල කාලයට වැටුප් නොගෙවීම මුලින් චෝදනා පත්‍රයක් නිකුත් කළ අවස්ථාවේදී සිදු නොවූ එහෙත් ඊට අදාල විධිමත් විනය පරීක්ෂණය අතරතුර සිදුවූ සිද්ධියක් සම්බන්ධයෙන් ඉහතකී විනය නියෝගය මගින් දඩුවමක් ලබාදී ඇති බවයි. ඊට හේතුව වන්නේ මෙම ඉල්ලුම්කරුගේ වැඩ තහනම් කරනු ලබන්නේ ආයතනය විසින් නිකුත්කරන ලද චෝදනා පත්‍රය සම්බන්ධයෙන් වූ විධිමත් විනය පරීක්ෂණය අතරතුර සිදුවූ කලහකාරී සිද්ධියක් හේතුකොට ගෙන වීමයි. එසේනම් එම වැඩ තහනම් කිරීම හේතුකොට ගෙන ඇති වන සියලුම කරුණු එකී සිද්ධියට අදාල කරුණු බව අවිවාදිත ය. එසේ වන විට එකී වරද සම්බන්ධයෙන් දඬුවම් පැමිණවීමට නම් ඒ කරුණ සම්බන්ධයෙන් වෙනම චෝදනා පත්‍රයක් නිකුත්කොට විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා එකී වරදට දඬුවම් නියම කිරීම කළ යුතුව තිබුණි. එහෙත් දෙවැනි පාර්ශ්වයේ නීතිඥ මහත්මිය විසින්ම එසේ චෝදනා පත්‍රයක් නිකුත්කර නොමැති බවත් අදාල මූලික විමර්ෂණයෙන් පසුව නැවත 2016-12-26 වැනි දින සිට සේවයේ පිහිටුවන ලද බවත් හරස් ප්‍රශ්ණ මගින් තහවුරු කර ඇත.

ඒ අනුව තහවුරු වන්නේ චෝදනා පත්‍රයක් නිකුත් කිරීමට තරම් පසුබිමක් හෝ නිරීක්ෂණයක් එකී මූලික විමර්ශණ වාර්තාව මගින් තහවුරුකර නොමැති බව වන අතර පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කාර සේවකයාගේ කලහකාරී හැසිරීම සම්බන්ධයෙන් වැටුප් වර්ධකයක් විලම්භනයට පමණක් නිර්දේශකර ඇති බවයි.

දෙවැනි පාර්ශ්වය විසින් ලබාදී ඇති අවසාන ලිඛිත සැලකිරීම් මගින් තහවුරු කිරීමට උත්සාහ ගෙන ඇත්තේ මෙම කාර්මික ආරාවුල විසදීමට අධිකරණ බලයක් මෙම බේරුම්කරණයට නොමැති බව සහ සාක්ෂිකරු පරස්පර විරෝධී සාක්ෂි ලබාදීමෙන් ඔහු විසින් ලබාදුන් සාක්ෂි පිළිගත හැකි සාක්ෂි නොවන බවට පත්ව ඇති බවත්, එමෙන්ම විනය පරීක්ෂණයේදී ලබාදුන් දඬුවම් සාධාරණ බවත් වේ.

මෙම පළමු පාර්ශ්වයේ සේවකයා වෙත නිකුත්කර ඇති චෝදනා පත්‍රය හා ඊට අදාල කරුණු මෙන්ම ලබාදී ඇති දඩුවම් සම්බන්ධයෙන් පළමු පාර්ශ්වය ඉල්ලීම්කර ඇත්තේ එහි ඇති වැඩ තහනම් කිරීමට ලක්කර ඇති කාලය තුළ වැටුප් රහිතව සේවයේ තැබීම අවලංගුකරවා දෙන ලෙසටත් එම කාලයට අදාල වැටුප් ලබාදෙන ලෙසටත් වේ. ඒ අනුව එකී චෝදනා පත්‍රයට සම්බන්ධයෙන් හෝ ඊට අදාල දඩුවම් සම්බන්ධයෙන් සේවකයා කම්කරු දෙපාර්තමේන්තුවට කිසිදු අවස්ථාවක ඉල්ලීමක් කර ඇති බවක් අනාවරණය නොවිය. හුදෙක්ම තමන්ගේ විනය පරීක්ෂණය සිදුවන අතරතුර සිදුවූ සිද්ධිය සම්බන්ධයෙන් පනවන ලද දඩුවම වෙනස්කරන මෙන් පමණක් ඉල්ලීම්කර ඇති බව නිරීක්ෂණය විය.

ඒ අනුව දෙවැනි පාර්ශ්වය විසින් තම ලිඛිත දේශන මෙන්ම බේරුම්කරන විභාගයේදී ඉදිරිපත්කරන ලද කරුණු සම්බන්ධයෙන් කිසිදු දෝෂයක් දක්නට නොලැබෙන නමුත්, විනය පරීක්ෂණය අතරතුර සිදුවූ සිද්ධියක් පාදක කරගනිමින්, එකී සිද්ධිය පරීක්ෂාකරන ලද මූලික විමර්ෂණ නිලධාරීන්ගේ නිර්දේශවලට පටහැනිව යමින් එකී කරුණ මත විනය නියෝගයක් පැනවීම අයුක්ති සහගත හා අසාධාරණ බව ඉතාමත් පැහැදිලි කරුණකි. මන්දයත් එකී චෝදනා සම්බන්ධයෙන් ඉල්ලුම්කාර සේවකයාට තම නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට හෝ විනය පරීක්ෂණයකට මුහුණදීමට හෝ අවස්ථාව සලසා දී නොමැත. මෙය ස්වාභාවික යුක්ති මූලධර්මයන්ට පටහැනි බව පෙනී යයි. තවද, එම තීරණය යුක්ති සහගත හා සාධාරණ බවින් තොර තීරණයක් බවද පෙනී යයි. අනික් අතට එකී මූලික විමර්ෂණයෙන් කිසිදු අවස්ථාවක ඉල්ලුම්කාර සේවකයා පහරදීමක් සිදුකල බවට මූලික විමර්ෂණ නිලධාරියා විසින් තහවුරුකර නොමැති අතර, උක්ත විනය පරීක්ෂණයේදී විනය පරීක්ෂණය මෙහෙයවන ලද නිලධාරී පෙරේරා මහතාගේ අදූරදර්ශී කටයුතු ගැන හෙළිදරව්කර ඇත.

තවද, දෙවැනි පාර්ශ්වය විසින් ඉදිරිපත්කර ඇති විරෝධතාවයක් වන මෙම කාර්මික ආරාවුල විසඳීමට මෙම බේරුම්කරණයට නෛතික බලයක් නොමැතිය යන්න තහවුරු කිරීමට තරම් කිසිදු සාක්ෂියක් දෙවැනි පාර්ශ්වය විසින් ඉදිරිපත්කර නොමැත. එනම්, දෙවැනි පාර්ශ්වය විසින් කියා ඇත්තේ මෙම ඉල්ලුම්කරුගේ සේවය අවසන් වීමෙන් පසු මෙම ආරාවුල පැන නැගී ඇති බව විනා, එසේ මෙම ආරාවුල කම්කරු කොමසාරිස්වරයා වෙත ඉදිරිපත්වී ඇත්තේ සේවකයාගේ සේවය අවසන් වීමෙන් පසුව බවට කිසිදු සාක්ෂියක් ඉදිරිපත් කර නොමැති බැවින් එම විරෝධතාවය ප්‍රතික්ෂේප කිරීමට සිදුවේ.

ඉහත සියලුම කරුණු සලකලා බැලීමේදී මෙම පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරුගේ වැඩ තහනම් කරන ලද 2016-06-28 වැනි දින සිට 2016-12-25 දින දක්වා වන කාලයේ වැටුප් නොගෙවීමෙන් චූදිතට අසාධාරණයක් වී ඇති බවට තීරණය කරමි. ඒ අනුව මෙම දෙපාර්ශ්වය අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී ඇති කරුණ වන

''පොල් වගාකිරීමේ මණ්ඩලයේ සේවය කළ ඩී. ඒ. රණධීර මහතාට 2016-06-28 දින සිට 2016-12-25 දින දක්වා වැඩ තහනමට ලක් කර සිටි කාලය සඳහා හිඟ වැටුප් නොගෙවීමෙන් අසාධාරණයක් සිදුව තිබේද? යන ප්‍රශ්ණයට ''අසාධාරණයක් සිදුව තිබේ'' යනුවෙන් පිළිතුරු සපයමි.

''එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන මොනවාද යන්න පිළිබඳව පහත පරිදි ඉහතකී කාලයට අදාලව හිඟ වැටුප් ගෙවීමට දෙවැනි පාර්ශ්වයට නියම කරමි. එම හිඟ වැටුප් පහත පරිදි ගණනය කර ඉදිරිපත් කරමි.

පළමු පාර්ශ්වයේ සේවකයා විසින් සකස්කර මා වෙත ඉදිරිපත් කර තිබූ හිඟ වැටුප් වාර්තාව පදනම් කරගනිමින් (ගොනුවේ පිටු අංක 241) පහත සඳහන් පරිදි හිඟ වැටුප දක්වා ඇත.

| *මාසය* | *වැටුප* | *වෛද්‍ය ආධාර* |
|---|---|---|
| ජූලි | 43024.00 | ------- |
| අගෝස්තු | 43024.00 | 2285.60 |
| සැප්තැම්බර් | 43024.00 | 2285.60 |
| ඔක්තෝබර් | 43024.00 | 2285.60 |
| නොවැම්බර් | 43024.00 | 2285.60 |
| දෙසැම්බර් | 37908.90 | 2285.60 |
| එකතුව | 253,028.90 | 11,428.00 |

ප්‍රදානය

1. ඒ අනුව පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කාර සේවකයාගේ වැඩ තහනම්ව සිටි කාලයට අදාලව හිඟ වැටුප හා වෛද්‍ය ආධාර දීමනා වශයෙන් නොගෙවා සිටි මුදල වන රුපියල් දෙලක්ෂ හැට හතර දහස් හාරසිය පනස් හයයි ශත අනූව (රු. 264456.90) ක මුදලක් මෙම ප්‍රදානය ගැසට් පත්‍රයේ පළවූ දින සිට මසක් ඇතුලත එම සේවකයාට ලබාගත හැකිවන පරිදි කම්කරු දෙපාර්තමේන්තුවේ නැගෙනහිර කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස්වරයා වෙත තැන්පත් කරන ලෙසට මෙයින් නියම කරමි.

2. තම සේවක අර්ථසාධක ඇතුළු අනිකුත් ව්‍යවස්ථාපිත හිමිකම් සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස්වරයා වෙත ඉල්ලීමක් කිරීමට මෙම ප්‍රදානය බාධාවක් නොවන බවද තීරණය කරමි.

මෙම ප්‍රදානය සාධාරණ හා යුක්ති සහගත තීරණයකි.

ඕබඩගේ ලීලාරත්න,
බේරුම්කරු.

2022 ඔක්තෝබර් මස 05 වැනි දින දී ය.

EOG 11 – 0024

---

මගේ අංක: IR/15/43/2010.

## කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2019.03.07 දිනැති හා අංක 2113/58 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.02.28 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් දිගන, රජවැල්ල, දිගන විලේජ්, වැලි පාර, අංක 207 හි පදිංචි ඩී. එච්. පතිරණ මයා සහ තලවතුගොඩ, එකමුතු මාවත, අංක 567/H/4 හි චන්ද්‍රම් රත්නම් ඒෂියන් ෆිල්ම් ලොකේෂන්, තැප්‍රොබේන් ස්ටූඩියෝස් රාන්ච් (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.08.20 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 ඔක්තෝබර් මස 19 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංක IR/15/43/2010.

**බේරුම්කරණ අංශය සහ කාර්මික අධිකරණයේ දී ය.**

ඩී. එච්. පතිරණ මහතා,
නො. 207, වැලි පාර,
දිගන විලේජ්,
රජවැල්ල,
දිගන.

*පළමු පාර්ශ්වය*

නඩු අංකය: A 16/2019

*සහ*

තැප්‍රොබේන් ස්ටූඩියෝස් රාන්ච් (ප්‍රයිවට්) ලිමිටඩ්,
චන්ද්‍රම් රත්නම් ඒෂියන් ෆිල්ම් ලොකේෂන්,
අංක 567/H/4,
එකමුතු මාවත,
තලවතුගොඩ.

*දෙවන පාර්ශ්වය*

අතර පවතින කාර්මික ආරාවුල

## ප්‍රදානය

කම්කරු සහ වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය, රවීන්ද්‍ර සමරවීර මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 සහ 1957 අංක 62 සහ 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියැවෙන) පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ කම්කරු සහ වෘත්තීය සමිති සබඳතා සහ සබරගමු සංවර්ධන අමාත්‍යවරයාට පැවරී ඇති බලතල ප්‍රකාරව, උක්ත ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා 2019.02.28 දිනැති නියෝගයෙන් බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

**බේරුම්කරණ විභාගයේ පසුබිම, පෙනී සිටීම සහ එය පැවැත්වූ ආකාරය:**

2019.02.28 දිනැති එකී නියෝගය මගින් කම්කරු සහ වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා විසින් බේරුම්කරණයෙන් විසඳීමට අංක IR/15/43/2010 දරන යොමුව යටතේ මා වෙත යොමු කර ඇති කාර්මික ආරාවුලට සම්බන්ධ කාරණය වන්නේ:

> ''තැප්‍රොබේන් ස්ටූඩියෝස් රාන්ච් (ප්‍රයිවට්) ලිමිටඩ් හි අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරන ලද ඩී. එච්. පතිරණ යන අයට 2007 ඔක්තෝබර් මස සිට 2009 සැප්තැම්බර් මස දක්වා වැටුප් හා දීමනා ලබා නොදී සේවය කළ කාර්යාලය වසා දමා සේවය අවසන් කිරීමෙන් ඔහුට අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳ ව වේ.''
>
> මෙම කාර්මික ආරාවුල සම්බන්ධයෙන් ම වූ යොමුවක් මීට පෙර අවස්ථාවක කම්කරු අමාත්‍යවරයා විසින් මා වෙත යොමු කරනු ලැබ එය අංක ඒ/3660 යටතේ විභාගයට ගන්නා ලදී. එහෙත් එම යොමුවේ දී සේවායෝජක ආයතනයේ ලිපිනය ලෙස ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කරන ලද ලිපිනයට යවන ලද ලිපි සියල්ල ආපසු හැරවී පැමිණි බැවින් එහි දෙවන පාර්ශ්වය ලෙස නම්කර තිබුණු සේවායෝජකයා බේරුම්කරණ විභාගයට කැඳවා ගැනීම අපහසු විය. කෙසේ වෙතත් සේවායෝජකයා වෙත ලිපි යැවිය හැකි ලිපිනයක් ඉදිරිපත් කරන ලෙස ඉල්ලුම්කරුට අවස්ථාව දෙන ලද නමුත් එය ද සාර්ථක නොවී බේරුම්කරණ විභාගයේ දෙවන පාර්ශ්වය වන සේවායෝජකයා සහභාගි කරවා ගැනීමට නොහැකි වීමේ හේතුවෙන් එකී ඉල්ලීම නිශ්ප්‍රභා කිරීමට සිදු විය. පසු ව ඉල්ලුම්කරු විසින් සේවායෝජක වෙත ලිපි යොමු කළ හැකි ලිපිනයක් සොයා ඉදිරිපත් කිරීමෙන් පසු ව නැවත ද ඒ/15/2019 යටතේ මෙම ආරාවුල බේරුම්කිරීම සඳහා කම්කරු අමාත්‍යවරයා විසින් නැවත ඉහත කී යොමුව මා වෙත කරනු ලැබ ඇත.

ඒ අනුව අළුත් විභාගයක් ලෙස ආරම්භ කරන ලද මෙම බේරුම්කරණ විභාගය සම්බන්ධයෙන් පළමු ප්‍රකාශ සහ දෙවන ප්‍රකාශ දෙපාර්ශ්වයන් දෙක වෙනුවෙන් ඉදිරිපත් කරනු ලැබීමෙන් පසු 2019.10.14, 2020.01.04, 2020.06.26, 2020.07.23, 2020.09.29, 2021.01.04, 2021.12.07, 2021.12.15, 2022.02.22, 2022.04.07 යන දිනයන්හි දී මා විසින් බේරුම්කරණ විභාගය පවත්වා අවසන් කර ඇත. පරීක්ෂණය සඳහා දින නියම කරනු ලැබූ දිනයන් කීපයක දී විවිධ හේතූන් නිසා බේරුම්කරණ විභාගය පැවැත්වීමට නොහැකි වූ බව ද සටහන් කරමි.

සහනය පැතූ ඩී. එච්. පතිරණ මහතා බේරුම්කරණ විභාගය පැවැත්වුණු අවසාන දින දෙක හැරුණු විට සෑම දිනක ම සහභාගි වූ අතර, ඔහු වෙනුවෙන් පරීක්ෂණයේ දී නීතිඥ ජානක විජේසිංහ, නීතිඥ සශික හෙට්ටිආරච්චි, නීතිඥ එස්. ආර්. ඩී. දිසානායක සහ නීතිඥ මෛත්‍රී වටවල යන නීතිඥ මහතුන් වරින් වර පෙනී සිටියහ. දෙවැනි පාර්ශ්වයේ සේවායෝජක සමාගමේ සභාපති කුමාර් චන්ද්‍රන් රත්නම් මහතා බේරුම්කරණ විභාගය පැවති 2020.01.06 දිනය හැර සෑම දිනක ම පෙනී සිටි අතර, දෙවැනි පාර්ශ්වයේ ආයතනය වෙනුවෙන් නීතිඥ ගිහාන් ලියනගේ මහතා බේරුම්කරණ විභාගය පැවති 2021.12.07 දිනය හැර සෑම දිනක ම පෙනී සිටියේ ය.

පළමුවැනි පාර්ශ්වයේ ඉල්ලීම සම්බන්ධයෙන් දෙවන පාර්ශ්වය විසින් ගෙන එන ලද මූලික විරෝධතා පිළිබඳ ව දෙපාර්ශ්වය හබකිරීම් සිදු කරන ලද නමුත්, පසු ව එකී මූලික විරෝධතා පසෙක තබා පරීක්ෂණය දිගට පවත්වාගෙන යාමට දෙවැනි පාර්ශ්වය එකඟ වීමෙන් පරීක්ෂණය ආරම්භ විය.

පළමුවැනි පාර්ශ්වය සාක්ෂි විභාගය පළමුවෙන් ආරම්භ කළ අතර එම පාර්ශ්වය වෙනුවෙන් සහනය පතන ඩී. එච්. පතිරණ යන අයගේ මූලික සාක්ෂිය ඇමුණුම් 03 ක් සහිතව පිටු 02කින් යුක්ත 2021.01.07 වැනි දින සහතික කරන ලද දිවුරුම් පෙත්සමක් මාර්ගයෙන් ඉදිරිපත් කරන ලදී. එකී දිවුරුම් පෙත්සම් සාක්ෂිය පිළිබඳ දෙවැනි පාර්ශ්වයේ නීතිඥ මහතාගේ හරස් ප්‍රශ්න විමසීම 2021.12.15 දින ආරම්භ කිරීමට නියම කරන ලද නමුත් එදින පළමුවැනි පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරයා එදින බේරුම්කරණ විභාගයට නොපැමිණි බැවින් ඉදිරි දිනකට කල් තැබීමට කරුණු යෙදුණි.

එදින දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මහතා පරීක්ෂණයේ කටයුතු වලට අගතියක් නොවන පරිදි, බේරුම්කරණ විනිශ්චය සභාවේ එකඟත්වය ඇති ව සමථ යෝජනාවක් ඉදිරිපත් කළේ ය. ඔහු කියා සිටියේ ඒ වන විට, මාසික වැටුප රු. 30,000/- ක් ලෙස සළකා ඒ පදනම යටතේ ඉල්ලුම්කරුට හිමි ව තිබුණු සේවක පාරිතෝෂික මුදල් 2007 වර්ෂයේ සිට ගණනය කොට ගෙවා ඇති බවයි. ඉල්ලුම්කරුට ආයතනයෙන් යම් හිඟ වැටුපක් ගෙවීමට ඇති බව පිළිගන්නා නමුත් ඔහු ඉල්ලා සිටින මුදල සමග තමා එකඟ නොවන බවයි. රු. 30,000/- මාසික වැටුප පදනම් කරගෙන ගණනය කරනු ලැබුවත් මෙම කාර්මික ආරාවුලට අදාල කාල පරිච්ඡේදය වන මාස 24 සඳහා ඉල්ලුම්කරුට ගෙවිය යුතු වන්නේ රු. 720,000/- ක් බව ඔහු පෙන්වා දුන්නේ ය. තව ද ඉල්ලුම්කරුගේ සේවය අවසන් කරනු ලැබ ඇතත් මේ වනතුරුත් කිසිදු බදු මුදලක් නොගෙවමින් නිල නිවසේ ඔහු තම පවුලේ සාමාජිකයින් සමග බලහත්කාරයෙන් රැඳී සිටින බවයි. තවද මෙම බේරුම්කරණ විභාගය තවදුරටත් දිග්ගැස්සී යාම වළක්වා ඉල්ලුම්කරුට සහනයක් සැළසීමේ අරමුණෙන් ඔහුගෙන් අය විය යුතු හිඟ නිල නිවාස බදු කුලිය වෙනුවෙන් හිලව් කිරීමක් සිදු කිරීමෙන් පසු ව ඉල්ලුම්කරුට සම්පූර්ණ සහ අවසානාත්මක ගෙවීමක් ලෙස රු. 500,000/- ක් ගෙවීමට සේවායෝජක පාර්ශ්වය එකඟත්වය පළකරන බව කියා සිටියේ ය. එකී ගෙවීම කිරීමට නම් ඉල්ලුම්කරු ඒ වන විටත් බලහත්කාරයෙන් රැඳී සිටි නිල නිවාසයෙන් ඉවත් විය යුතු බවට වන කොන්දේසිය ද සපුරා ලිය යුතු බවට කරුණු දැක්වීය.

පළමුවැනි පාර්ශ්වයේ ඉල්ලුම්කරු මෙම සමථ යෝජනාව ගැන සතුට පළ කළ අතර ඒ සඳහා මූලික ව එකඟත්වය ද පළ කළේ ය. කෙසේ වෙතත් යෝජනාව පිළිබඳ ව තම පවුලේ සාමාජිකයින් සමග සාකච්ඡා කිරීමකින් තොර ව ස්ථිර තීරණයක් ගත නොහැකි බව පැවසීය. ඒ අනුව පවුලේ සාමාජිකයින්ගේ එකඟතාව ලබාගන්නේ නම් එසේ කොට තීරණයක් ගැනීමට 2022.01.10 දිනයේ දී පැමිණිය යුතු බවත්, එසේ නොමැති නම් සාක්ෂි විභාගය ආරම්භ කරන බවත් පාර්ශ්වකරුවන්ට දැනුම් දෙන ලදී.

කෙසේ වෙතත් 2022.01.10 දිනය වන විට ඉල්ලුම්කරු පතිරණ මහතා මිය ගොස් ඇති බව ඔහුගේ පවුලේ අය විසින් කාර්මික අධිකරණයේ ලේඛකාධිකාරී වෙත දැනුම් දී තිබුණ බැවින් එදින පරීක්ෂණය එදින නොපවත්වා, ඉල්ලුම්කරු මිය ගොස් ඇතිනම් මරණ සහතිකය ඉදිරිපත් කරමින් ඔහුගේ භාර්යාව හෝ වෙනත් බලය පවරන ලද කෙනෙකුට ඉදිරිපත් වීම සඳහා අවස්ථාව දෙමින් බේරුම්කරණ විභාගය 2022.02.22 දිනට කැඳවන ලදී.

ඒ අනුව විභාගය කැඳවන ලද නමුදු 2022.02.22 දින විභාගයට පළමුවැනි පාර්ශ්වය වෙනුවෙන් කිසිවෙකු සහභාගි වූයේ නැත. නීතිඥවරයෙකු හෝ බලය පවරන ලද නියෝජිතයෙකුවත් පැමිණ සිටියේ නැත. එදින දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මහතා කියා සිටියේ යොමුවට අදාල ආරාවුල පැවතියේ ඩී. එච්. පතිරණ නමැති පළමුවැනි පාර්ශ්වයේ ඉල්ලුම්කරු සහ තම සේවායෝජක දෙවැනි පාර්ශ්වය අතර බවයි. මේ අතරතුර ඉල්ලුම්කරු මිය යාමෙන් පසු එකී යොමුව බලරහිත වන බවයි. ඒ අනුව යොමුවට අදාල ඉල්ලීම නිශ්ප්‍රභා කරන ලෙස වැඩිදුරටත් ඉල්ලා සිටියේ ය.

කෙසේ වෙතත් ඉල්ලුම්කරු වෙනුවෙන් ඔහුගේ භාර්යාව හෝ වෙනත් කෙනෙකුට තවදුරටත් කරුණු කියා සිටීමට අවස්ථාවක් ලබා දීමේ අරමුණෙන් අවසාන වශයෙන් පරීක්ෂණයට 2022.03.31 දිනය නියම කොට ලියාපදිංචි තැපෑලෙන් ලිපියක් යැවීමට තීරණය කරන ලදී.

එළඹුණු හේතුන් මත 2022.03.31 දිනය වෙනස් කොට 2022.04.07 වැනි දිනට පරීක්ෂණය පැවැත්වෙන බවට කාර්මික අධිකරණයේ ලේඛකාධිකාරී විසින් ඩී. එච්. පතිරණ මහතාගේ භාර්යාවටත්, දෙවැනි පාර්ශ්වයටත් දැනුම් දී ඇත.

ඒ අනුව 2022.04.07 වැනි දින බේරුම්කරණ විභාගයට සඳහා රැස්වුන නමුත් පළමුවැනි පාර්ශ්වය වෙනුවෙන් කිසිවෙකු ඊට සහභාගි වුනේ නැත. නීතිඥවරයෙකු හෝ බලය පවරන ලද නියෝජිතයෙකුවත් පැමිණ සිටියේ නැත. එදින පරීක්ෂණයේ දී දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මහතා සැළකිරීමක් කරමින් පළමුවැනි පාර්ශ්වය කීප වතාවක් ම නොකඩවා පෙනී නොසිටි බැවින් ද, එම නිසා පළමුවැනි පාර්ශ්වයට මෙම පරීක්ෂණ විභාගයට තවදුරටත් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවක් කැමැත්තක් ඇති බවක් නොපෙනන බැවින් ද, පැමිණිලිකරුගේ සාක්ෂිය මෙහෙයවීමට නොහැකි වී ඇති බැවින් ද, පැමිණිල්ල නිශ්ප්‍රභා හෝ ප්‍රතික්ෂේප කරන ලෙස ඉල්ලා සිටියේ ය. ඒ අනුව එදින දී බේරුම්කරණ විභාය අවසන් කිරීමට තීරණය කරන ලදී.

**නිගමනය**

දින ගණනාවක් පළමුවැනි පාර්ශ්වයේ නියෝජනයක් සිදු නොවූ බැවින්, කරුණු සියල්ල සලකා බැලීමෙන් පසු ව මෙම යොමුවට අදාල කාර්මික ආරාවුල සම්බන්ධයෙන් වන බේරුම්කරණ විභාගය තවදුරටත් පවත්වාගෙන යාමට නොහැකි බවට නිගමනය කරමි.

**ප්‍රදානය**

කම්කරු සහ වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා විසින් 2019.02.28 දින බේරුම්කරණයෙන් නිරවුල් කිරීමට යොමු කරන ලද අංක IR/15/43/2010 දරන යොමුවට අදාල කාර්මික ආරාවුල සම්බන්ධයෙන් වූ ඉල්ලුම්කරුගේ ඉල්ලීම නිශ්ප්‍රභා කරමි.

එස්. විරිතමුල්ල,
බේරුම්කරු.

2022 අගෝස්තු මස 20 වැනි දින.
බේරුම්කරණ අංශය සහ කාර්මික අධිකරණයේ දී ය.

EOG 11 - 0025

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.